**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2025.11.12 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2025 නොවැම්බර් මස 12 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | |
|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති- | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | කේ.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | රාජේන්ද්‍රන් තිෂෝක් මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ජී.ඉන්දික කුමාර මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | එම්.ප්‍රදීපා ඉඳුම්ණී කුලරත්න මැතිතුමිය. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.ජෙහන් මෝහන් මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති තුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරිතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.(2025.10.08)**

2025.10.08 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

02. **සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.නැත**

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ජී.සචිනි සෙව්වන්දි මැතිතුමිය සභාවට නොපැමිණි අතර, එතුමිය විසින් නිවාඩු ඉල්ලීමක් ඉදිරිපත් නොකළ හෙයින් එතුමියගේ නිවාඩු අනුමත නොකරන ලදී.

**04.ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

01.පළාත් පාලන දෙපාර්තමේන්තුවේ CLG/AC/04/05/13 හා 2025.10.10 දිනැති ලිපියෙන් අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන දූෂණ විරෝධී නීතිය සහ සුපිළිපන්බව පිළිබඳ පළාත් පාලන ආයතන සභිකයින් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහනක් 2025.11.26 වන දින පෙ.ව.9.00 සිට ප.ව.2.30 දක්වා සබරගමුව පළාත් සභා ශ්‍රවනාගාරය, නව නගරය,රත්නපුර යන ස්ථානයෙහි පැවැත්වීමට නියමිතය.මෙම පුහුණු වැඩසටහන සඳහා සියලුම සභිකයන් සහභාගී වන ලෙස දැනුම් දී සිටිමි.

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න -නැත**

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

**I.ගරු සභාපති එම්.ජී.ඒ. ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.**

01.2025.09.11 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 26 යටතේ ලබා ගත් තීරණයට අනුව, විනෝද බදු ආඥා පනත ප්‍රකාරව එකම බල ප්‍රදේශයක් තුල විනෝද බදු 02ක් පනවා ගැනිමට නෛතික ප්‍රතිපාදන නොමැති බැවින් විනෝද බදු 15%ක් ලෙස පනවා ගැනිමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 01**

ඒ අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ඉල්ලුම්කරුවන්ගේ හා පිටතින් පැමිණෙන ඉල්ලුම්කරුවන්ගෙන් විනෝද බදු ප්‍රතිශතය 15%ක් ලෙස පනවා ගැනීම ඒකමතිකව සහා සම්මත විය.

02. 2025.07.14 දිනැතිව සන්නස්ගම තේ කර්මාන්ත ශාලාවෙහි කළමණාකරණ අධ්‍යක්ෂ විසින් රත්නපුර පාර වම 1225/4 යන වරිපනම් අංක දරන තේ කර්මාන්ත ශාලාවෙහි වරිපනම් සඳහා සහන ඉල්ලීම් ලිපියට අනුව,50%ක සහනයක් ලබා දිම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලීමක් කළ අතර ඒ අනුව මෙම කර්මාන්ත ශාලාව වසා තැබූ කාල සිමාවට අදාළ (2024/2025වර්ෂය සඳහා) ගෙවිය යුතු වරිපනම් මුදලින් 50%ක් වන රු.193,477.68ක මුදල කපා හැරීම අනුමත කිරිම සඳහා සභා තීරණයක් අවශ්‍ය බව දන්වා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 02**

රත්නපුර පාර වම 1225/4 යන වරිපනම් අංක දරන තේ කර්මාන්ත ශාලාව වසා තැබූ කාල සිමාවට අදාළ (2024/2025වර්ෂය සඳහා)ගෙවිය යුතු වරිපනම් මුදලින් 50%ක් වන රු.193,477.68ක මුදල කපා හැරිම ඒකමතිකව සහා සම්මත විය.

03.ගල්ලෙපිට ආදාහනාගාර ඉඩමෙහි අවමංගල්‍යාධාර උත්සව ශාලාවක් ඉදි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා විසින් හෙළ බොජුන් හළ ඉදිකිරිම සඳහා ගල් උළුවස්සාහේන භූමියෙහි තත්වය සළකා බලා ඉංජිනේරු වරු විසින් දක්වන ලද කරුණු අනුව කෝටි 04ක මුදලක් වැය වන බවත් මෙම අවස්ථාවේදී හෙළ බොජුන් හළක් ඉදිකිරීම ගැටළුකාරී බැවින් දැනට පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලක්ෂ 150ක් ලැබෙන අතර, ඊට සුදුසු පරිදී ගල්ලෙපිට ආදාහනාගාර ඉඩමෙහි අවමංගල්‍යාධාර උත්සව ශාලාවක් ඉදි කිරීම සම්බන්ධව යෝජනාව පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම යෝජනාව සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබුණ බව ප්‍රකාශ කරන ලදි.

**තීරණ අංක 03**

ගල්ලෙපිට ආදාහනාගාර ඉඩමෙහි අවමංගල්‍යාධාර උත්සව ශාලාවක් ඉදි කිරීමට ඒකමතිකව සහා සම්මත විය.

04.2026 වර්ෂයේ අය වැය කෙටුම්පත අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා විසින් 1948 නිදහස ලබා ගත් පසු මේ රටේ බිහිවූ දේශපාලන පක්ෂ ගණනාවක් පාලනය කළ අතර,වසර 75කට අධික කාලයක් මේ රට වෙනුවෙන් සැළකිය යුතු දෙයක් කර තිබෙනවා.නමුත් 2022,2023 අතර කාලයේදී අපේ රට ආර්ථික වශයෙන් බුන්වත් භාවයකට පත්වෙනවා.ඒත් එක්කම ලෝකයේ ජාත්‍යන්තර ප්‍රජාව අපිව තනි කරනවා.රට වල් වලට ඇතුළු වීමට ඇති ඉඩප්‍රස්ථාව නැති කරනවා,වීසා ලබා දීම නතර කරනවා,ඒතාක් භාණ්ඩ අපනයනයේදී අපට ලබා දුන් කාල පරිච්ඡේද අවසන් කරනවා,අත්පිට භාණ්ඩ ලබා ගැනීමේ ක්‍රමවේදයක් ඇති වෙනවා .ඒත් එක්කම රට විශාල අර්බුධයකට ගමන් කරනවා ඒ ගමන් කිරීමත් සමඟ අප රටේ මහජනතාව තමන්ගේ දේශපාලන තීරණ වල හැරවුමක් සඳහා පොදු ජනතා තීන්දුවක් ගන්නව පළමු වරට 2024 නොවැම්බර් මාසයේ මහ මැතිවරණයේදී එය තහවුරු කරනවා එහි අර්ථය වන්නේ ජාතික ජන බලවේග රජයට අවම වශයෙන් වසර 05ක කාලයක් ස්වකීය වැඩ කොටස රට වෙත ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙනවා.ඒ අනුව එම මැතිවරණ තුනේම පොදුවේ පොදු මහජනතාව කිසියම් නිශ්චිත බහුතරයකින් ජාතික ජන බලවේගයට ස්වකීය ප්‍රතිපත්ති හා අරමුණු මේ රටේ ජනතාවට ඉදිරිපත් කිරීමට අවකාශයක් සලසා දෙන ලදි.ඒ අවකාශයෙන් වසරක් පමණක් ගෙවී ඇති හෙයින් තව ඉදිරියට කාලය තිබෙනවා .කිසියම් ආකාරයකට රට හැටියට අදාළ කාලය සාර්ථකව හෝ අසාර්ථකව නිම කිරීමට බොහෝ විට මේ රටේ දේශපාලන ප්‍රවාහයන් ඉඩ ප්‍රස්තාව සලසා දී තිබෙනවා.ඒවා කඩාකප්පල් කිරීමක් සිදුවුනේ නැහැ ඉතිහාසය තුල ඒ අනුව අපි බලාපොරොත්තුවෙනවා මේ රටේ පොදු ජනතාව ගත්ත තීන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඉඩ ප්‍රස්ථාව විවර කරන ලද කාල පරිච්ඡේදය තුළ ජාතික ජන බලවේගයට ස්වකීය වැඩ කොටස කරගෙන යාමට සදාචාරාත්මක අයිතියක් තිබෙන බව විශ්වාස කෙරේ.එම ප්‍රතිපත්තිය මත පිහිටා එහෙත් ජාතික දේශපාලනයේ ඇති බොහෝ ප්‍රශ්න

අපගේ ප්‍රාදේශිය සභාව වෙත කාන්දු නොකරගෙන මේ දක්වා මේ ප්‍රාදේශීය සභාව පවත්වාගෙන ආවා. ජාතික තලයේ දේශපාලන කරුණු බොහෝ විට මෙහිදී සාකච්ඡා කිරීමක් හෝ වාද විවාදයක් සිදු කලේ නැහැ.එයට හේතුව ප්‍රාදේශිය සභාවක් යනු ජාතික දේශපාලන කරුණු මත එල්බගෙන කටයුතු කරන මධ්‍යස්ථානයක් නොවන බවත් මෙහි අරමුණ ප්‍රදේශයේ සංවර්ධනය හා විශේෂයෙන් පොදු ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමයි. ප්‍රාදේශිය සභාවක් හැටියට පැවරෙන වගකීම වන්නේ සභාවකින් දැනට පවතින පොදු ජනතාව වෙනුවෙන් සිදු කරගෙන යන කටයුතු ඒ තත්වයෙන් පවත්වාගෙන යාම හා ඒ කටයුතු වල ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනිම සඳහා මෙහි රැස්වී සිටින ජනතා නියෝජිතයින් හැටියට නිර්මාණාත්මකව ගුණාත්මකභාවයේ වර්ධනයක් ඇති කිරීම මෙහි විෂය පථයයි.අපගේ තේමා පාඨය වශයෙන් පෙහොසත් රටක් ලස්සන ජීවිතයක් තත්වය මත එම අරමුණු වලට ගමන් කිරීම සඳහා සමාජ, ආර්ථික ,පාරිසරික,දේශපාලන සාධකයන් මෙහෙයවීම සම්බන්ධයෙන් මෙම ගරු සභාවේ අපි මෙතෙක් සාමදානයෙන් කටයුතු කරනු ලැබුවා.ඒ වෙනුවෙන් සභාපතිවරයා ලෙස මාගේ ගෞරවය ගරු උප සභාපතිවරයාගේ නායකත්වය යටතේ මෙම ගරු සභාවට කෘතඥතාවයත් පළ කර සිටිමි.එසේම අපගේ විෂය පථයන් වන සෞඛ්‍ය සේවා ,භෞතික සැලසුම්,මංමාවත්, ඉඩම් ගොඩනැගිලි,මහජන උපයෝගිතා සේවා, සුභසාධක සේවා මහජන නියෝජිතයින් රහිතව සිදු කරනු ලැබුවා දැන් මහජන නියෝජිතයින් සිටින නිසා සංවර්ධන කටයුතු වලට මානය සම්පත අදාළ කරගන්න පුළුවන්.ඒ අනුව අපගේ බල ප්‍රදේශය තුල අලංකාර නගරයක් නිර්මාණය කිරීම ,මංමාවත් දියුණු කිරීම,මහජන උපයෝගිතා වැඩි කිරීම,සුභ සාධක සේවා පුළුල් කිරීම යන කාරණා සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව අය වැය කෙටුම්පතෙහි 2026 වර්ෂයේ අයවැය සාරාංශයෙහි ආදායම් තත්වය මෙහිදී 2026 උපකල්පනය කරන පරිදී වර්ෂයේදී උත්පාදිත ආදායම රු.37,351,606.00ක් ලෙසත්,වෙනත් උසාවි දඩ,මුද්දර ගාස්තු ,වැටුප් ප්‍රතිපූර්ණ ,මන්ත්‍රී දීමනා ඇතුළු බාහිර සාධක මත අපගේ ආදායම් තත්වය රු.109,136,956.00ක් වශයෙන් ඇස්තමේන්තු ගත කරන අතර,සමස්ථයක් වශයෙන් 2026 වර්ෂයේ ආදායම් උත්පාදනය රු.146,488,562.00 ක් වශයෙන් උපකල්පනය කරන අතර,ප්‍රාග්ධන ලැබීම් වලින් රු.57,500,000.00ක් දැනට අපේක්ෂා කර තිබේ.ඒ අනුව පුනරාවර්ථන වියදම් ලෙස රු.136,485,434.00ක්ද ප්‍රාග්ධන වියදම ලෙස රු.67,500,000.00ක් දළ වශයෙන් ඇස්තමේන්තු කර තිබේ.

මෙම වසරේ විෂයන් කිහිපයක් ක්‍රියාත්මක නොවීම නිසා එම විෂයන් වලට අදාළව වෙන්කරනු ලබන මුදල් නැවත පරිපූරක ඇස්තමේන්තුවක් සකස් කර රු.ලක්ෂ 70ක මුදලක් මේ වසර තුල වියදම් කිරීමට නියමිතය.ඒ මුදල් අවම වශයෙන් රු.ලක්ෂ 2ක් ගරු මන්ත්‍රී වරුන්ගේ සංවර්ධන යෝජනා වෙනුවෙන් කිරීමට නියමිතය.මෙම මුදල එකතු වන්නේ මෙම වර්ෂයේ වැය නොවුන මුදලක් ඒ අනුව අද දින සිට ඔබතුමන්ලා වෙත වෙන් කරනවා.ඉදිරිපත් කර ඇති සංවර්ධන යෝජනා ඉක්මනින් ඇස්තමේන්තු කර සිදු කිරීමටත් එහි බිල්පත් මෙම වර්ෂය අවසානයට පෙර ලබාදෙන ලෙසත් ගරු සභාවට සිහිපත් කරමි.

ග්‍රාමීය සංවර්ධන යෝජනා සඳහා මෙම වර්ෂයේ යම් මුදලක් වෙන් කර ඇතත්,2026 වර්ෂයේ අයවැයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා සභා අරමුදලින් ලක්ෂ 23ක් වෙන් කර ඇත.මෙවැනි මුදලක් වෙන් කිරීමට සිදු වූයේ වැටුප් ප්‍රතිපූර්ණයෙන් 20%ක් සභාව මඟින් දැරීමට සිදු විමයි.දැනටමත් වැටුප් සඳහා 8%ක් සභා අරමුලකින් දරනු ලබයි.එවිට වැටුප් සඳහා 28% පමණ මුදලක් සභාව මඟින් දරණු ලබයි. 2026 වර්ෂයේත් වැටුප් ප්‍රතිපූර්ණයෙන් 20%ක් සභාව මඟින් දැරීමට සිදුවේ.අවුරුදු පහක්යන විට මෙම ආයතනය සඳහා රජයෙන් කිසිම මුදලක් නොලැබෙන බවත්,ස්වයං උත්පාදන ආයතනයක් බවට පත්වීමට නියමිතයි.නමුත් කෝටි 04ක මුදලක් පළාත් සභාවෙන් හා මධ්‍යම රජයෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.2026 වර්ෂයේ අපි ග්‍රාමීය සංවර්ධන යෝජනා සඳහා රු.42,300,000.00ක මුදලක් වෙන් කරනු ලැබුවා මෙම මුදල සමානව සියලු මන්ත්‍රිවරුන් සඳහා වෙන් කරනු ලැබේ.

ඒ අනුව 2026 වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදම රු. .67,500,000.00ක් ඇස්තමේන්තු කරනු ලැබේ.

විදුලි ලාම්පු 500ක් සභාවේ ඒකමතික තීරණය අනුව මිලදී ගත් අතර එම විදුලි ලාම්පු 500 කොට්ඨාශ වල මන්ත්‍රීවරුන් අතර බෙදාදෙනු ලැබුවා.එක ග්‍රාම නිලධාරී වසමක් සඳහා විදුලි ලාම්පු 10 සවි කිරීමට නියමිතය.ප්‍රධාන මාර්ගය සඳහා 130ක් පමණ වෙන් කර තිබෙන අතර,370ක් බෙදල තිබෙනවා ගරු මන්ත්‍රීතුමන්ලාගේ කොට්ඨාශ සඳහා ඉදිරියේදී එම ලාම්පු සවි කිරීමට නියමිතය.තවත් විදුලි පහන් 250ක් පමණ මිලදි ගැනීමට නියමිතය.

විශේෂයෙන් මෙම කෙටි කාලය තුල සභාව පවත්වාගෙන යාම සඳහා ගරු උප සභාපති නලින් සේනක මාගම්මන මැතිතුමා හා ගරු විපක්ෂනායක සෝමරත්න මැතිතුමාටත්,සභාවේ ජොෂ්ඨ මන්ත්‍රීවරුන්ටත්,සියලුම මන්ත්‍රීවරුන්ටත්,ආසනයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් රාජපක්ෂ මැතිතුමාටත් මෙම කටයුතු වෙනුවෙන් සහයෝගය ලබා දෙන ප්‍රාදේශිය සභාවේ ලේකම් තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට,සෞඛ්‍ය කාර්යය මණ්ඩලයට ,මහා සංඝ රත්නයට ස්තුතිය පුද කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් මෙම අය වැය කෙටුම්පත සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් අයවැය බෙදීමකින් තොරව සහයෝගය දක්වා පැල්මඩුල්ලෙහි සංවර්ධනයට දායක වන ලෙස ඉල්ලා සිටින ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා.</u>

මෙම අයවැයට විරුද්ධවීමට හේතු ගණනාවක් පවතින බවත්ය.පිට්ටනියකට ලක්ෂ 05ක් වෙන් කිරීම සතුටු

වනබවත්, නමුත් 20%ක් කප්පාදු වන බවත් ඉදිරියේදී 40%ක් කප්පාදු කිරීමට නියමිත බැවින් ආදායම් උත්පාදනය පිළිබඳ වගේ වගක් නැතිව අය වැය සකසා ඇති බවත්ය.අයවැයෙහි එකතැනක් විතරක් සාකච්ඡා කළ නොහැකි බවත්,මෙහි වෙනස් විය යුතු තැන් ගොඩක් ඇති බවයි. තවද ආදායම් උත්පාදනය කිරීමට ඇති ගලි බවුසරය සඳහා ලබන අවුරුද්දට ගලි බවුසරය සඳහා ඇස්තමේන්තු කර තිබෙන්නේ රු.1000.00ක් බවත්ය.

සෑම විටම කොම්පෝස්ට් පොහොර මඟින් සභාව පවත්වාගෙන යන බවට ප්‍රකාශ කළත්,2024 වර්ෂයේදි රු.58,140.00ක මුදලක් ආදායම ලබා ගෙන ඇති අතර 2026 වර්ෂය සඳහා රු.60,000.00 කට සීමා කර තිබෙනවා.මේවා අලුත් විදියට ක්‍රියාත්මක විය යුතුය.මෙසේ විය යුතු නැහැ.එසේනම කෙසේද පැල්මඩුල්ල ලස්සන කරන්නෙ.අපිට ලක්ෂ 2 දුන්න පළියට ලස්සන පැල්මඩුල්ලක් සැකසිය නොහැකි බවත්,අපිත් ආසයි ලස්සන පැල්මඩුල්ලකට සේවය කිරීමට බව ප්‍රකාශ කරන ලදි.

තවද ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවෙන් ඉල්ලා අස්වන බව ප්‍රකාශ කරන ලදි.මේ වන විට කමිටුවක් මඟින් එක මතයකට එළඹීමට නොහැකි තත්වයකට පත්වි සිටී.මෙම ක්‍රමවේදය විධිමත් විය යුතුයි.මෙම අය වැයට විරෝධය පළ කරන බව ප්‍රකාශ කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා.</u>

මගේ කොට්ඨාශයට විදී ලාම්පු ලබා දිම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරන අතරම කොට්ඨාශ තුල වීදි ලාම්පු සවි කිරීමේදී වෙනත් මන්ත්‍රීවරුන් ඒ සඳහා සම්බන්ධ නොකරන ලෙසත්,නිලධාරියෙකු සම්බන්ධ කිරීම සුදුසු බවත්ය.20%ක වැටුප් ප්‍රතිපූර්ණයක් සිදු කිරීමට සිදුවේ.මෙම මුදල් ආදායමට ලැබෙන්නේ කෙසේද යන්න මෙහි පැහැදිළිව සඳහනක් නොමැත. ගරු සභාපති තුමා විශාළ මෙහෙයක් කරනව පැල්මඩුල්ල හදන්න මිනිසුන්ට සේවය කරන්න එහෙත් මේවට මුදල සොයාගන්නා ක්‍රමයක් නැහැ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් මාර්ග සංවර්ධනයක් සිදු වෙනවා.මේ පිළිබඳ සභාව දැනුවත්ද යන්න ගැටළුකාරියි.ප්‍රාදේශිය සභා මාර්ග සංවර්ධනය කිරීමේදී මෙම මාර්ග වලට ඔරොත්තු නොදෙන ආකාරයේ වාහන වලින් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම හේතුවෙන් ධම්මරක්ඛිත මාර්ගයේ වේල්ලක් කැඩී ඇති බවත්,ඒ ගැන විශේෂ අවධානයක් යොමු කළ බවත්, ප්‍රාදේශිය සභා මාර්ගයක් සංවර්ධනය කිරීමේදි ප්‍රාදේශිය සභාව දැනුවත් වීමක් සිදු විය යුතු බවයි.වැටුප් සඳහා 40% ක් සොයා ගන්නේ කෙසේද යන්න මෙහි සඳහනක් නොමැත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා.</u>

අපි සභාවට ආවේ වියදම් අවම කරල ගමට සේවයක් කිරීමට බවත්,මෙම අයවැය සඳහා විරුද්ධ වීමට අඩුපාඩු කම් පේන බවත්,ආදායමක් සොයන්න බලාපොරොත්තු වුනාට ආදායම කෙසේද සොයන්නෙ කියල සඳහනක් නොමැත.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව තුල ආදායම සෙවීමට තිබෙන සුන්දර දේවල් ලෙස දිය ඇලි හැඳින්විය හැක.කිරිඳි ඇල්ල,රජනාව ඇල්ලට විශාල මුදලක් වියදම් කරන ලදි. කිරිඳි ඇල්ල,රජනාව ඇල්ල සඳහා 2024 වර්ෂයෙහි සත්‍ය ආදායම රු.98,750.00ක්ද 2025 වර්ෂය සඳහා රු.1000.00ක්ද මෙම මුදල 2026 වර්ෂය සඳහා රු.500,000.00ක් දක්වා ඉහළට ගේන්න කටයුතු කර තිබෙන බවත් මෙම ආදායම ඉහළ නංවන්නේ කෙසේද යන්න සඳහනක් නැති බවයි.

සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.200,000.00ක් ලබා දිම ගැන ස්තූතිවන්ත වන අතර,කුණු ට්‍රැක්ටරය මාරපනට එවන්න කියල යෝජනාවක් ගෙන ආවත් එය තාම ක්‍රියාත්මක වීමක් නැත.මාරපන පාලම කැඩිල හදල දෙන්න යෝජනා කළා එම වසමේ මන්ත්‍රීතුමියට රු.200,000.00ත් මදි පාලම හදල ඉවර කරන්න.මේක අත්‍යවශ්‍ය කාරණයක්.මේවා සොයල බලන්න ක්‍රියාත්මක භාවයක් නැහැ.අවශ්‍ය දේ අවශ්‍ය වෙලාවට සිදු කරන්න ඕනි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා.</u>

කොම්පෝස්ට් පොහොර වල තත්වය ඍනාත්මක බවත් මෙම තත්වය ඇතිවූයේ අද ඊයෙක නොවන බවත්,මෙම පොහොර නිෂ්පාදනයේදී ගුණාත්මකභාවයකින් තොරව ක්‍රියාත්මක වී ඇති බවත්,මෙම පොහොර නිෂ්පාදනය සඳහා විධිමත් ක්‍රමවේදයක් පැවතිය යුතු බවයි.මේ වන විට කෘෂිකර්ම උපදේශකවරයෙකුගේ උපදෙස් ලබා ගනිමින් කරපිංච කෘෂිකර්ම මධ්‍යස්ථානයට සාම්පල් යැවීමටත් එසේ නොමැති නම් ගන්නෝරුව කෘෂිකර්ම මධ්‍යස්ථානයට සාම්පල් යැවීම සඳහා කටයුතු සිදු කළ බවත්,කසළ කළමනාකරණය හා පොහොර සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සකසන බව ප්‍රකාශ කරන ලදි.

අය වැයෙහි ගැටළුකාරී තැන් නිරාකරණය කිරීම සඳහා ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මහතාගේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා ස්ථිර කරන ලදි.(පෙ.ව.11.15)

මෙම අවස්ථාවේදී අය වැය සම්බන්ධ විෂය නිලධාරී කැඳවන ලදි.

501-1 ,6-25II ,102-1 I ,1-63, වරෙන්තු දඩ යන වැය විෂයන්හී තිබෙන ගැටළුකාරී තැන් සාකච්ඡා කර ගැටළු නිරාකරණය කර ගන්නා ලදි.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මහතාගේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා ස්ථිර කරන ලදි.(පෙ.ව.11.40)

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා.

මෙම අයවැය කෙටුම්පත සාකච්ඡාවේදි ගරු සභාපතිතුමා ඉදිරිපත් කළ අදහස් වලට එකඟවෙන්න බැරි තත්වයක් තිබෙන බවත්,පෙර ඉදිරිපත් කරන ලද කයිීන පිංකම් ආශ්‍රිත මාර්ග වලට වීදි ලාම්පු සවි කර දෙන ලෙස යෝජනා ඉදිරිපත් කලත් මේ වන තෙක් මෙය ක්‍රියාත්මක නොවූනු බවත් ඉදිරියේදී පැවැත්වීමට නියමිත සුමන සමන් දේව ප්‍රතිමාව වඩම්මන පෙරහැර මාර්ගයෙහි වීදි ලාම්පු සවි කර දෙන ලෙස ඉල්ලීම් කරන ලදි.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයෙහි වැඩ පිළිවෙළ ගැටළුකාරී තත්වයක පවතින බැවින් මෙම ස්ථානයට සුදුසු නිලධාරියෙකු යොමු කිරීම තුලින් ඇතිවන අක්‍රමිකතා වළක්වාගත හැකි බවත්මේ සම්බන්ධව සුදුසු තීරණයක් ලබා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.

පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු කටයුතු වලට සහයෝගය ලබා දුන් බවත්,වීදි ලාම්පු මිලදී ගත් පසු සාකච්ඡාවක් සිදු කර මෙම වීදි ලාම්පු සවි කිරිමට ප්‍රමුඛතාවය ලබා දිය යුතු ස්ථාන වලට ප්‍රමුඛතාවයක් ලබා නොදී හිතු මනාපෙට කටයුතු වූ බවක් පෙනුනා.මේ අය වැය කෙටුම්පතෙහි ආදායම් උත්පාදනය පිළිබඳ අඩු සැළකිල්ලක් දක්වා ඇති බවත්,මීට වඩා සාධනීය යහපත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබුණ හෙයින් අපට සිදු වී තිබෙනවා මේ අයවැයට විරුද්ධ වීමට සිදු වන බවත් ප්‍රකාශ කර සිටින ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් 2026 වර්ෂයේ අයවැය යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් අවශ්‍ය බව යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්.කේ.කපිල ජගත් ගුණතිලක මහතා විසින් ඡන්දය විමසන ලද අතර,2026 වර්ෂයේ ඇයවැය සම්බන්ධයෙන් පහත පරිදී ගරු සභිකවරුන් ඡන්දය ප්‍රකාශ කරන ලදි.

**2026 වර්ෂයේ අයවැය සඳහා පක්ෂ වූ ගරු සභිකයින් -**

| | | |
|---|---|---|
| 01 .ගරු ප්‍රාදේශීය සභා සභාපති | - | එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා. |
| 02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 07 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 08 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රාජේන්ද්‍රන් තිෂෝක් මැතිතුමා. |
| 09 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ඉන්දික කුමාර මැතිතුමා. |
| 10 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 12 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය |
| 13 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 14 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමා. |
| 15 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය. |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා. |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 18 .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |

**2026 වර්ෂයේ අයවැය සඳහා විපක්ෂ වූ ගරු සභිකයින් -**

| | | |
|---|---|---|
| 01. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා. |
| 01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා |
| 02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය. |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා. |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමාගේ |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ධනේෂ් කුමරන් මැතිතුමාගේ |

15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - එම්.ප්‍රදීපා ඉදුමිණී කුලරත්න මැතිතුමිය.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජෙහාන් මෝහන් මැතිතුමා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ජී.සචිනි සෙව්වන්දි මැතිතුමිය එදින සභාවට නොපැමිණෙන ලදි.

ඒ අනුව දී පක්ෂව ඡන්ද 18 ක් හා විපක්ෂව ඡන්ද 18ක් ලෙස සමාන වූ බැවින් ගරු සභාපති තුමාට තීරක ඡන්දය හිමි විය.එතුමා අය වැය සඳහා පක්ෂව තීරක ඡන්දය ලබා දෙන ලදි.

**තීරණ අංක 04**

2026 වර්ෂයට අදාළ අයවැය කෙටුම්පත සම්බන්ධව සභාවේ එකඟතාවය මත සිදු කළ ඡන්ද විමසීමේ දී පක්ෂව ඡන්ද 18 ක් හා විපක්ෂව ඡන්ද 18ක් ලෙස සමාන වූ බැවින් ගරු සභාපතිතුමාගේ තීරක ඡන්දයෙන් 2026 වර්ෂයට අදාළ අයවැය සභා සම්මත විය.

ගරු සභාපතිතුමන් විසින් 2026 අයවැය පණිවිඩය හා ප්‍රතිපත්ති ප්‍රකාශය සභාගත කරන ලදි.

05.කසල කළමනාකරණ කටයුතු වෙනුවෙන් ශ්‍රමය මිලදී ගැනීමේ පදනමින් බඳවා ගත් ඩබ්.සුමිත් මයා,ජේ.එන්.ගයාන් ලක්මිණ මයා ,ආර්.උදයකුමාර් මයා, ඒ.උදය කුමාර් මයාගේ සේවා ගිවිසුම් කාලස මාස 03කින් දීර්ඝ කිරීම අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05**

ඒ අනුව,පහත නම් සඳහන් නිලධාරීන්ගේ සේවා ගිවිසුම් කාලය මාස 03කින් දීර්ඝ කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංකය | නම | තනතුර | ගිවිසුම් කාලය |
|---|---|---|---|
| 01. | ඩබ්.සුමිත් මයා | සෞඛ්‍ය කම්කරු | 2025.11.09-2026.02.09 |
| 02 | ජේ.එන්.ගයාන් ලක්මිණ මයා | සෞඛ්‍ය කම්කරු | 2025.11.08-2026.02.08 |
| 03 | ආර්.උදයකුමාර් මයා | සෞඛ්‍ය කම්කරු | 2025.11.09-2026.02.09 |
| 04 | ඒ.උදය කුමාර් මයා | සෞඛ්‍ය කම්කරු | 2025.11.18-2026.02.18 |

06.පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අයත් සතිපොළ 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් පවසා සිටියේ සතිපොළ 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සුදුසු බවත්,ඒ මගින් දැනට ලබන ආදායමට වඩා වැඩි ආදායමක් ලබා ගත හැකි බවයි .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් පවසා සිටියේ මේ කාල සීමාව තුල පොළ ගැන සමීක්ෂණයක් පැවැත්වූ බවත්,එහිදී මෙහි විධිමත්භාවයකින් තොරව අක්‍රමිකතා වන බවයි.සභාවට ලැබිය යුතු ආදායම් නොලැබෙන බවත්,සොයා බැලීම්වලදී අනාවරණය වු කාරණයක් වන්නේ ලැබෙන ආදායමට වඩා වැඩි මුදලක් සති පොළෙන් උපයාගත හැකි බවයි.පොළ වීධිමත් ලෙස සංවර්ධනය කොට එක් වර්ෂයක් සභාව මගින් පොළ පවත්වා බැලීම සුදුසු බවයි.මෙහි ප්‍රගතිය බලා ඊළඟ පියවරට යෑම සුදුසු බවයි.තවද පොළ භූමියෙහි කඩ කාමර 142ක් (රු.250.00 අය කරන) පවතින බවත් මෙහි නිත්‍ය හිමිකාරීත්වය හිමිවන්නේ 124ක පමණයි.1 කඩ කාමරය හැර 7 දක්වා කඩ කාමර වල වෙළඳාම් නොකරන බවත්,මෙම කඩ කාමර වල වෙනත් කඩ කාමර හිමියන් තමන්ගේ බඩු බාහිරාදිය තබා ඇති බවත් එයින් කිසිදු මුදලක් අය නොකරන බවයි.ගෙවීම් නොකර භාවිතා කරන කඩ කාමර ලෙස අංක 7,13,12,130 හැදින්වීමට හැක.ස්ථිර නොමැති වෙළඳුන් ප්‍රමාණය 15කි.පොළෙහි මුරකරු ලෙස සේවය කරන දර්ශන මයා හට කඩ කාමර 05ක්(කඩ කාමර 83,136,137,140,141) පවතින බවත් එය කෙසේද යන්න සොයා බැලිය යුතු බවත්,මෙම පොළ භූමියෙහි පිටත පවතින කඩ කාමරද විධිමත් විය යුතු බවයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටිනු ලැබුවේද සති පොළ ටෙන්ඩර් කිරීම සුදුසු බවයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ප.ව.12.15 ට සභාවෙන් පිටවන ලදි.

**තීරණ අංක 06**

2026 වර්ෂය සඳහා සතිපොළ සභාව විසින් පවත්වගෙන යාම සුදුසු බව සභා සම්මත විය.

07. පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අයත් වරිපනම් අංක 11/1 කඩ කාමර- 02 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමසඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07</u>**

2026 වර්ෂය සඳහා වරිපනම් අංක 11/1 කඩ කාමර- 02 විධිමත් ක්‍රමවේදය අනුව ටෙන්ඩර් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ධනේශ් කුමරන් මැතිතුමා ප.ව.12.30ට සභාවෙන් පිටවන ලදි.

08. පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අයත් සතිපොළ රථගාල 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය පවසා සිටියේ රථ ගාල භූමිය ටෙන්ඩර් කිරීමට විරුද්ධ බවයි.එයට හේතු වශයෙන් පෙන්වන්නේ මෙම රථගාල විධිමත් ක්‍රමවේදයකට සකස් කිරීම තුලින් වැඩි ආදායමක් උත්පාදනය කළ හැකි බවයි.රථ ගාල භූමිය සංවර්ධනය කර, අය කරන මුදල වැඩි කිරීම සුදුසු බවත්ය.පතල් සඳහා භාවිතා කරන කොට මෙම භූමියෙන් ඉවත් කර එම භූමියෙත් රථ නවතා තැබීමට සුදුසු ආකාරයට සැකසිය යුතු බවත්ය.තවද රථ ගාල භූමියෙහි ටිකට් පත් නිකුත් කරන නිලධාරියාට රැදී සිටීමට ස්ථානයක් සැකසීම සිදු කළ යුතු බවයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසා සිටියේ එකපාර ව්‍යාපාර ඉවත් කිරීම නුසුදුසු බවයි.එසේ කරන්නේ නම් සහන කාලයක් ලබා දෙන ලෙස පවසන ලදි.

**<u>තීරණ අංක 08</u>**

2026 වර්ෂය සඳහා සතිපොළ රථගාල සභාව විසින් පවත්වාගෙන යාම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

09. පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අයත් සති පොල අසළ වැසිකිළිය 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 09</u>**

2026 වර්ෂය සඳහා සති පොල අසළ වැසිකිළිය විධිමත් ක්‍රමවේදය අනුව ටෙන්ඩර් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

10. කිරිඳි ඇල්ල ප්‍රවේශ මාර්ගය හා නැරඹුම් මධ්‍යස්ථානය 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 10</u>**

කිරිඳි ඇල්ල ප්‍රවේශ මාර්ගය හා නැරඹුම් මධ්‍යස්ථානය වයි.සමන් ප්‍රියදර්ශන මයා වෙත 2026 වර්ෂය සඳහා බදු කාලය දීර්ඝ කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

11. පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අයත් අංක 14 මාළු කඩය 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 11</u>**

2026 වර්ෂය සඳහා අංක 14 මාළු කඩය විධිමත් ක්‍රමවේදය අනුව ටෙන්ඩර් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

12. පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අයත් අංක 13 කඩ කාමරය 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 12</u>**

2026 වර්ෂය සඳහා අංක 13 කඩ කාමරය විධිමත් ක්‍රමවේදය අනුව ටෙන්ඩර් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

13.ලෙල්ලෝපිටිය **"රුක්මලේ කුඹුර"** නැමති ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශිය සභාවට අත්පත් කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 13</u>**

ලෙල්ලෝපිටිය **"රුක්මලේ කුඹුර"** නැමති ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීම සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අත්පත් කර ගැනීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

14.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය හා සභික මණ්ඩලය සඳහා අභිප්‍රේරණ පුහුණු වැඩසටහනක් (Academy of Adventure(pvt)Ltd, kumbalgama, Belihul-oya) පැවැත්වීම සඳහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 14</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය හා සභික මණ්ඩලය සඳහා අභිප්‍රේරණ පුහුණු වැඩසටහනක් (Academy of Adventure(pvt)Ltd, kumbalgama, Belihul-oya) 2025.12.14 වන දින පැවැත්වීමටත්, ඉදිරිපත් කර ඇති රු.301,500.00ක වියදම් ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත වූ අතර, ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කිරීමට ද ඒකමතිකව සභා සම්මත විය.

15. ප්‍රාදේශිය සභාවේ දැන්වීම් පුවරු,වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථා කෙටුම්පත අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 15</u>**

ප්‍රාදේශිය සභාවේ දැන්වීම් පුවරු,වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථා කෙටුම්පත ඒකමතිකව සභා සම්මත විය.

16. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය,විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 16</u>**

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය,විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත ඒකමතිකව සභා සම්මත විය.

17.පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ත්‍රී රෝද රථ නැවතීමේ ස්ථාන 38 පිළිබඳව ස්ථානීය පරීක්ෂනයන් සිදු කිරීමෙන් අනතුරුව මෙම ත්‍රී රෝද රථ ගාල් සියල්ලම ප්‍රාදේශිය සභා මාර්ග වලට අයත් නොවන හෙයින් ,මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් නීතිමය හැකියාවක් නොමැති බැවින් අය කර ගත යුතු හිඟ මුදල් කපා හැරීමට හා ත්‍රී රෝද රථ සංගම් ලේඛන වලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 17</u>**

සභා බල ප්‍රදේශය තුල ත්‍රී රෝද රථ නැවතීමේ ස්ථාන ලෙස නම් කර ඇති ස්ථාන 37කින් ගාස්තු අය කර ගැනිම පිණිස ලේඛනගතව ඇති ,ඒහෙත් නීත්‍යානුකූලව අය කර ගත නොහැකි රු.3,834,750.00ක ත්‍රී රෝද රථ ගාස්තුව ලේඛනවලින් කපා හැරීමටත් ලේඛනයේ බිල් කිරීම් නතර කිරීමත් සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ අතර, ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කිරීමට ද ඒකමතිකව සභා සම්මත විය.

18. රු.7,014,579.00ක පරිපූරක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 18</u>**

ඒ අනුව,

| **වැය ශීර්ෂය** | **මුදල (රු.)** |
|---|---|
| 109-2 සී.සී.ටී.වී කැමරා මිලදී ගැනීම සඳහා | 400,000.00 |
| 204-1 යන්ත්‍ර සූත්‍ර වාහන අලුත්වැඩියාව | 300,000.00 |
| 304-1 යන්ත්‍ර සූත්‍ර වාහන අලුත්වැඩියාව | 314,579.00 |
| 304-6 හදිසි ආපදා හා වෙනත් | 1,000,000.00 |
| 309-1 ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 4,000,000.00 |
| 604-3 වීථි පහන් | 1,000,000.00 |
| එකතුව | 7,014,579.00 |

රු.7,014,579.00ක පරිපූරක ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

19.2024 වර්ෂයේ රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන යටතේ අනුමත බුදුලෙන විහාර මාවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි වැඩ අවසන් වූ පසු අදාළ බිල්පතට අනුව ප්‍රධාන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය වූ රු.1,583,809.12ක මුදල තිසර සුභසාධක අවමංගල්‍යාධාර සමිතිය වෙත ආවරණ අනුමැතිය යටතේ ගෙවන ලදි.එම ගෙවීම අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 19</u>**

බුදුලෙන විහාර මාවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි වැඩ අවසන් වූ පසු අදාළ බිල්පතට අනුව ප්‍රධාන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය වූ රු.1,583,809.12ක මුදල තිසර සුභසාධක අවමංගල්‍යාධාර සමිතිය වෙත කරනු ලැබූ ගෙවීම ඒකමතිකව සහා සම්මත විය.

20.පැල්මඩුල්ල නගරය,පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ග සඳහා ආලෝකකරණයට 150**w** කෝබ්‍රා විදුලි පහන් කට්ටල 20ක් මිලදී ගැනීම සඳහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 20</u>**

150**w** කෝබ්‍රා විදුලි පහන් කට්ටල 20ක් හා එය සවි කිරන ආධාරකය සඳහා අඟල් 1 ½ විශ්කම්භය හා අංශක 135 ආනතිය සහිත අඩි 04 දිග **GI** බටය, ක්ලැම්ප් ( clamp) හා පොට දිග අඟල් 12 ප්‍රමාණයේ ගැල්වනයිස් ඇණ (එක් වීදි පහනකට 02 බැගින්) විධිමත් ක්‍රමවේදය ඔස්සේ මිලදී ගැනීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**<u>II.ගරු ප්‍රාදේශීය උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමාගේ යෝජනා.</u>**

01. අක්‍රියව ඇති වීදි ලාම්පු සම්බන්ධයෙන් දීර්ඝ කාලයක සිට කථා කළත් මේ දක්වා පිළිතුරක් ලැබී නැත.මේ වන විය බෞද්ධ විහාරස්ථාන වල කඨින පිංකම් හා 2025.10.20 වන දින දීපවාලි උත්සවය පැවැත්වේ මේ නිසා සභාපතිතුමාගේ අවධානය යොමු කර හැකි ඉක්මනින් වීදි ලාම්පු අවශ්‍ය ස්ථාන වල සවි කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 21</u>**

මේ වන විට වීදි ලාම්පු සවි කරන බවත්,ඉදිරියේදී කොට්ඨාශයේ පවතින අක්‍රිය වීදි ලාම්පු සවි කිරීම සඳහා වීදි ලාම්පු ලබා දෙන බවත් ඒකමතිකව සහා සම්මත විය.

02.අක්කර 10 අතුරු මාර්ගයේ අඩි 70වක් පමණ කොටසක් සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන ද්‍රව්‍ය ලබා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 22</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂනයක් සිදු කර ලැබෙන නිර්දේශ හා මුදල් ප්‍රතිපාදන මත ඉදිරියේදී අක්කර 10 අතුරු මාර්ගයේ අඩි 70වක් පමණ කොටසක් සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන ද්‍රව්‍ය ලබා දීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය

03.වැටුප් ප්‍රතිපූර්ණය සඳහා 20%ක මුදලක් සභා අරමුදළින් දැරීමට සිදුවීමෙන් ප්‍රාදේශීය සභා වල දෛනික කටයුතු කරගෙන යාමට නොහැකි තත්වයක් උදාවී ඇති නිසා එම 20% සභා අරමුදලින් අය කර ගැනීමට ඇති ක්‍රියාමාර්ග අත්හිටවන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 23</u>**

මෙම ගැටළුව පිළිබඳව අදාළ පාර්ශව දැනුවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

04.අක්කර 31 පහළ බෝපිටිය ඇති ප්‍රාදේශිය සභාවට අයත් ඉඩම මැන නිරවුල් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 24</u>**

අක්කර 31 පහළ බෝපිටිය ඇති ප්‍රාදේශිය සභාවට අයත් ඉඩම මැන නිරවුල් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

05.පැල්මඩුල්ල රෝහලේ ගිලන් රථය සති කිහිපයක සිට කැඩී ඇති බව රෝහල් කාර්යය මණ්ඩලය පවසයි.මේ නිසා පැල්මඩුල්ල අවට ජනතාව දැඩි අපහසු තත්වයට පත්ව ඇත.එම නිසා අදාළ අංශ දැනුවත් කර ඉක්මනින් පියවර ගත යුතු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 25</u>**

පැල්මඩුල්ල රෝහලේ ගිලන් රථය අලුත්වැඩියා කර ඇති බව ගරු සභාව දැනුවත් කරන ලදි.

**<u>III.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාගේ යෝජනා.</u>**

01.2025.09.26 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු තීරණ අංක 12 යටතේ,ශ්‍රී ලංකා ටෙලිකොම් පුද්ගලික සමාගමේ පැල්මඩුල්ල ශාඛාව පවත්වාගෙන යනු ලබන ස්ථානයට අදාළව ,බිම් බදු ලබා ගැනීම සුදුසු බවත්, ටෙලිකොම් ආයතනයට ඇතුළුවන ස්ථානයේ පවතින බස් නැවතුම්පළ අසල කාණු දෙපස බංකු දෙකක් තබා සංවර්ධනය කිරීමටත්,මේ පිළිබඳ ටෙලිකොම් ආයතනයට දන්වා යැවීම සුදුසු බවත්,එසේ නොවන්නේ නම් පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ වියදමින් එය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 26</u>**

ශ්‍රී ලංකා ටෙලිකොම් පුද්ගලික සමාගමේ පැල්මඩුල්ල ශාඛාව පවත්වාගෙන යනු ලබන ස්ථානයට අදාළව බිම් බදු ලබා ගැනීම සඳහා එම ආයතනය හා සාකච්ඡාවන් පැවැත්වීමටත් , එහි නීතිමය තත්වය පිළිබඳ අධ්‍යනයක් සිදු කිරීමටත්,ටෙලිකොම් ආයතනයට ඇතුළුවන ස්ථානයේ පවතින බස් නැවතුම්පළ අසල කාණු දෙපස බංකු දෙකක් තබා සංවර්ධනය කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

02. 2025.09.26 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු තීරණ අංක 06 යටතේ සංචාරක වශයෙන් ආකර්ශණිය ස්ථානයක් ලෙස නම් කර ඇති කිරිදි ඇල්ල සංචාරකයන්ගේ පැමිණීම වැඩි කර ගැනීම තුල ආදායම් උත්පාදනය ඉහල නංවා ගත හැකි බැවින් මේ සඳහා යෝග්‍ය වැඩ පිළිවෙලක් සකස් කර ගැනීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 27</u>**

මේ සම්බන්ධව විශේෂඥ උපදෙස් ලබා ගැනීමටත්,කඩිනමින් යෝග්‍ය වැඩපිළිවෙළක් සකස් කර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03. 2025.09.26 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු තීරණ අංක 15 යටතේ පැල්මඩුල්ල නගරයේ ත්‍රී රෝද රථ නවතා තැබීමේදී මතුවන ගැටළු වලට විසඳුමක් ලෙස පික් මී (**pick me**) සේවාව පැල්මඩුල්ල නගරය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා පවසා සිටියේ මේ පිළිබඳව රත්නපුර pick me ආයතනයෙන් විමසීමක් කළ බවත්,මේ වන විට බඳවා ගැනීම් සිදු කර ගෙන යන බවත්,දැනටමත් පැල්මඩුල්ල,පාතකඩ ,සන්නස්ගම,ලෙල්ලෝපිටියෙහි මෙම සේවාව ක්‍රියාත්මක ක්‍රියාත්මක වන බව දන්වා සිටින ලදි.

**<u>තීරණ අංක 28</u>**

පෞද්ගලික ආයතනයක් මඟින් මේ සේවාව ක්‍රියාත්මක වන බැවින් මෙම කාර්යයට මැදිහත් නොවීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**<u>IV.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.</u>**

01.2025.08.5 වන දින 2025.09.22 වන දිනයන්හිදී පැවති පරිසර හා පොදු පහසුකම් කමිටුවේදී කසළ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා යොදවා ඇති වාහන සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කළ අතර නමුත් තවදුරටත් කසළ කළමනාකරණ ක්‍රියාවලිය අකර්මන්‍ය වෙමින් පවතී.එම තත්වය මඟ හරවා ගැනිමට ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසා සිටියේ ඉහළ බෝපිටිය හංදියෙහි කුණු දැමීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව පවසන ලදි.

**<u>තීරණ අංක 29</u>**

කසළ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා යොදවා ඇති වාහන අලුත්වැඩියා කිරීමෙන් පසුව කසළ කළමනාකරණ ක්‍රියාවලිය නිසි පරිදී සිදු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

V.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වි.නිර්මික දීපාල් මැතිතුමාගේ යෝජනා.

01.මාරපන මැදවෙල,මාරපන දකුණ ,ගොඩගෙදර පහළවෙල දොඹගස්වැල්පල යන මාරපන කොට්ඨාශයේ ඉහත සඳහන් කරන ප්‍රදේශයන්හි අයාලේ සැරිසරන ගවයින් 30ක් පමණ සිටින අතර එම සතුන් නිදැල්ලේ සැරි සැරීම නිසා මාර්ග අනතුරු හා වගා හානි සිදුවේ.එයට විසඳුමක් ලබා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 30**

මේ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.අයාලේ යන ගවයින් රැක බලා ගැනීමට සහ භාරගැනීමට කැමති අය ඇත්නම් අවශ්‍යය නීතිමය තත්වයන් යටතේ ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 31**

මේ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03.පනගම ප්‍රධාන මාර්ගයෙහි ඩේවිඩ් කඩය අසළ ඇති පොදු ළිඳ මීට පෙර ප්‍රාදේශීය සභාව මඟින් බැමි දමා සාදන ලද එහි බැමි ගැළවී ළිඳ තුලට වැටී ඇත.එය නැවත ප්‍රතිසංස්කරණය කර ජනතාවට ලබා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 32**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසුව මෙම පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**VI.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ධනේෂ් කුමරන් මැතිතුමාගේ යෝජනා.**

01.අප සභාවට භාෂා පරිවර්තනය සඳහා MICK හා SPEAKER ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 33**

විධිමත් ක්‍රමවේදය ඔස්සේ මිල ගණන් කැඳවා ප්‍රතිපාදන තත්වය සළකා බලා මිලදී ගැනීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

02.මත්ද්‍රව්‍ය (කසිප්පු) භාවිතය වැළැක්වීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 34**

මෙම මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම දැනටමත් රජය මඟින් ඉටු කරන බැවින් මේ සඳහා සභාව මැදිහත් නොවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03.නො.03,කට්ටංගෙ ඉහළ කොටසේ තිබෙන පොදු ස්ථානවලින් තිබෙන විදුලි කම්බි වෙනුවට කේබල් භාවිතා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසා සිටියේ විදුලි කම්බි වෙනුවට කේබල් භාවිතා කිරීම දැනටමත් ක්‍රියාත්මක වන බවයි.

**තීරණ අංක 35**

විදුලි මණ්ඩලය වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

04.කට්ටංගෙ පාරේ ට්‍රාන්ස්ෆෝමරය අසළ තිබෙන දොළ පිරිසිදු කිරීම හා එම දොළට බෝක්කුවක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 36**

සභාව මඟින් දොළ පිරිසිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**VII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමියගේ යෝජනා.**

01.උඩතුල වසමේ පදිංචි එල්.එච්..ගුණවතී මහත්මියගේ ගෙවතු වගාව සඳහා කොම්පෝස්ට් පොහොර,බීජ වර්ග ලබා දී ඇයට සහනයක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාරි බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 37**

උඩතුල වසමේ පදිංචි එල්.එච්..ගුණවතී මහත්මියගේ ගෙවතු වගාව සඳහා කොම්පෝස්ට් පොහොර,බීජ වර්ග ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**VIII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමාගේ යෝජනා.**

01.බයිගෙදර වත්ත හරහා ර/පාතකඩ බෞද්ධ විද්‍යාලය වෙත දිවෙන මාර්ගය පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 38**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ප්‍රතිපාදන තත්වය සළකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.සකඩයාවත්ත,දේවාලෙගම,පාතකඩ,පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි කේ.නන්දසේන කරුණාරත්න මයාගේ දිරාපත් වී ඇති වහළය සකසා ගැනීම සඳහා ආධාරයක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 39**

සභා අරමුදලින් දැරීමට මෙම වර්ෂය සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති බැවින් අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

03.පාලුගම්පළ ,උඩහ කන්ද මාර්ගයේ බෝක්කුවක් පිළිසකර කිරිමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 40**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ප්‍රතිපාදන තත්වය සළකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**IX.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමාගේ යෝජනා.**

01.බැරණ්ඩුව මන්නගෙවත්ත මාර්ගයේ මීටර 30ක පමණ අබළංව වූ කොටස කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 41**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ප්‍රතිපාදන තත්වය සලකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.උඩදළුව ක්‍රීඩා පිටිය බැකෝ යන්ත්‍රය යොදා සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 42**

බැකෝ යන්ත්‍රය යොදා සුද්ධ පවිත්‍ර කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03.බුදුලෙන අක්කර 10කොටසේ පිවිසුම් මාර්ග නොමැති නිවාස 06කට නව මාර්ගයක්(බැකෝ යන්ත්‍රය යොදා)සැකසීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 43**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ප්‍රතිපාදන තත්වය සලකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

04. පිවිසුම් මාර්ග නොමැති ගාල වත්ත උඩ කොටසේ නිවාස 07කට නව මාර්ගයක්(බැකෝ යන්ත්‍රය යොදා)සැකසීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 44**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ප්‍රතිපාදන තත්වය සළකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**x. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමාගේ යෝජනා.**

01.පසුගිය දිනවල පැවති අයහපත් කාළගුණික තත්වය හේතුවෙන් අප බල ප්‍රදේශයේ නිවාස කිහිපයකට එනම් බළංගොඩ පාර කාමරංගපිටිය ලිපිනයේ පදිංචි රුවන් හෙළ උඩ මහතාගේ නිවසට,බැරණ්ඩුව අක්කර 30 ලිපිනයේ පදිංචි යොහාන් සංජය සිරිවර්ධන මහතාගේ නිවසට හානි සිදු වී ඇති අතර එම නිවෙස් සඳහා ආධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 45**

මේ පිළිබඳව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ආපදා අංශය වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

02.කෙටේතැන්න ගල්උළුවස්ස කසළගොඩ අසළ පදිංචිව සිටි රංජිත් ශාන්ත මහතා එම ස්ථානයෙන් ඉවත්ව සිටින අතර එම මහතා සඳහා සධාරණයක් ඉෂ්ඨ කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් මැතිතුමා පවසා සිටියේ මෙම ඉඩමෙහි අනවසර පදිංචි පවුල් 07ක් සිටින හෙයින් ඔවුන්ට සභාව මඟින් සාධාරණයක් සිදු කරනවා නම් රංජිත් ශාන්ත මහතා හටද සාධාරණයක් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

**තීරණ අංක 46**

මෙම ඉඩම ප්‍රාදේශිය සභාව සතු ඉඩමක් බවත්,රජයේ ඉඩම් පුද්ගයන්ට ලබා දීමේ නීතිමය තත්වයක් නොමැති බවත් මෙම ඉඩමේ පදිංචි අනවසර පදිංචි කරුවන්ට සාධාරණයක් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**xi. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමාගේ යෝජනා.**

01.වන්නිආරච්චිගම ක්‍රීඩාංගනය පිළිසකර කර ක්‍රීඩා කිරීමට සුදුසු ආකාරයට සැකසීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 47**

වන්නිආරච්චිගම ක්‍රීඩාංගනය පිළිසකර කර ක්‍රීඩා කිරීමට සුදුසු ආකාරයට සැකසීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02. වන්නිආරච්චිගම පවතින ඔසු උයනද නිරීක්ෂණය කර සභාවෙන් පවත්වාගෙන යන ඔසු උයනක් ආකාරයට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 48**

වන්නිආරච්චිගම පවතින ඔසු උයන නිරීක්ෂණය කර, සභාවෙන් පවත්වාගෙන යන ඔසු උයනක් ආකාරයට සංවර්ධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**xii. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාගේ යෝජනා.**

01.තලංගම මාර්ගයෙන් බෙදෙන ඉහළවත්ත පාර පිවිසුම සකස් කිරීම සඳහා ද්‍රව්‍ය ලබා දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 49**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු මුදල් ප්‍රතිපාදන තත්වය මත මෙම සංවර්ධනය සිදු කිරීමටත්, එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතනය වෙත යොමු කිරීමත් සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

02.මල්වතු හේන් යායේ සිට හකමුව පොත්තකන්ද ,ඇත්ඔය දක්වා ගම මැදින් ඇති මාර්ග සඳහා හියුම් පයිප්ප 9ක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 50**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු මුදල් ප්‍රතිපාදන තත්වය මත හියුම් පයිප්ප ලබා දීමටත්, එසේ හැකියාවක් නොමැතිනම් අදාළ ආයතනය වෙත යොමු කිරීමත් සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

03.තලංගම මාර්ගයේ සිට ආරාමය දක්වා ඇති පාර සඳහා හියුම් පයිප්ප 4ක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 51**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු මුදල් ප්‍රතිපාදන තත්වය මත හියුම් පයිප්ප ලබා දීමටත්, එසේ හැකියාවක් නොමැතිනම් අදාළ ආයතනය වෙත යොමු කිරීමත් සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය..

**xiii. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.**

01.නාරංගොඩ වසමේ දිලෙන තරු ක්‍රීඩා සමාජය විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා පිටියට රාත්‍රී කාලයේ ක්‍රීඩා කිරීම සඳහා විදුලි පහන් සවි කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 52**

හැම කොට්ඨාශයකටම අයත් ක්‍රීඩා කිරීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රීඩා පිටි සඳහා විදුලි පහන් සවි කිරීමට ඇති හැකියාව පිළිබඳව අදාළ ආයතනයන් වෙතින් විමසීමක් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.කුට්ටාපිටිය වසමේ කිරිදි ඇල්ල ඉහළ පිවිසුම් මාර්ගය (ප්‍රධාන පාලම අසළ)පඩිපෙළ සංවර්ධනය කර එම ස්ථානයේ විශේෂයෙන් කාන්තාවන් සඳහා ඇඳුම් මාරු කිරීමටත්,එතනට පැමිණෙන පුද්ගලයන්ගේ අවශ්‍යතාවය අනුව කුඩා වෙළඳසැළක්,එම ස්ථානයේ ටිකට් කවුන්ටරයක්,ඇල්ලට යන අයට ටිකට් පතක් නිකුත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 53**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර කාන්තාවන් සඳහා ඇඳුම් මාරු කිරීමටත්,එතනට පැමිණෙන පුද්ගලයන්ගේ අවශ්‍යතාවය අනුව කුඩා වෙළඳසැළක්,එම ස්ථානයේ ටිකට් කවුන්ටරයක් සැකසීම සඳහා ස්ථානයක් සොයා ගැනීමටත්,මෙහි නීතිමය තත්වය සොයා බලා ඉදිරියේදී මෙම කාර්යය සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**xiv. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදය කුමාර ගුණවර්ධන මැතිතුමාගේ යෝජනා.**

01.ඉහළ හකමුව කජුහේන මාර්ගයේ අඩි 20 කොටසක් ධනසේකර මුදලාලිගේ කඩේ අසළ ඉතා අබළංව ඇති කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 54**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ප්‍රතිපාදන තත්වය සළකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය ඒකමතිකව සහා සම්මත විය.

02.ඉහළ හකමුව කජුහේන මාර්ගයේ පීල්ල අසළ ඉතා අබළං තත්වයේ පවතින අඩි 20ක කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 55**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ප්‍රතිපාදන තත්වය සළකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය ඒකමතිකව සහා සම්මත විය.

**xv. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමාගේ යෝජනා.**

01.ප්‍රාදේශිය සභාව සතු මාර්ග සංවර්ධනය කිරීමේදී (කොන්ක්‍රීට්/තාර)මාර්ගය දෙපස සීමා සළකුණු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 56**

මෙම මාර්ග ගැසට් කිරීමෙන් පසු සීමා මායිම් ලකුණු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.රාත්‍රී 11.00න් පසු අධික ශබ්ධයෙන් JBL යන්ත්‍ර ක්‍රියාත්මක කර භාවිතා කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 57**

ඉදිරි කටයුතු තිරීම සඳහා JBL යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම තුලින් අගතියට පත්වන පුද්ගලයන් 03 දෙනෙකුගේ අත්සනින් ලිපියක් ලබා දෙන ලෙසත්,පොලීසියට පැමිණිලි කිරීම තුලින්ද මෙම කාර්යය ඉටු කර ගැනීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**xvi. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමාගේ යෝජනා.**

01.ගනේගම මිදලන පාරේ දෙනවක ගහ හරහා පාලමේ ගස් වැවී ඇති බැවින් ඒවා සුද්ධ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 58**

ස්ථානීය පරික්ෂාවක් සිදු කිරීමෙන් පසුව ලැබෙන නිර්දේශ සළකා බලා ගනේගම මිදලන පාරේ දෙනවක ගහ හරහා පාලමේ වැවී ඇති බැවින් ගස් සුද්ධ කිරීම ඒකමතිකව සහා සම්මත විය.

02.පැල්මඩුල්ල සුවහස් මල් සංගමය ඔවුන්ගේ මල් ප්‍රදර්ශන ගනේගම පන්සල ඉදිරිපිට සිදු කරයි.ඔවුන් සඳහන් කරන පරිදී එයට විශාළ වියදමක් දැරීමට සිදු වන නිසා එය පොළ අසල රථ ගාල භූමිය ලබා දීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 59**

එම ස්ථානයේ අනෙකුත් කටයුතු වලට බාධාවක් නොවන පරිදී අදාළ ගාස්තු ගෙවා රථ ගාල භූමිය වෙන් කරවාගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**xvii. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.පුවනේෂ්වරි මැතිතුමාගේ යෝජනා.**

01.පනාවැන්න කොට්ඨාශයේ 06,ගොඩගම ,පැල්මඩුල්ල වතුයායේ කෝවිල අසළ සිට පාසල දක්වා කොන්ක්‍රීට් කරන ලද පාරත් සමඟ කාණු පද්ධතිය වැඩිදියුණු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 60**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ප්‍රතිපාදන තත්වය සළකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය ඒකමතිකව සහා සම්මත විය.

**හදිසි යෝජනා අංක 01**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.**

01.පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට අයත් කසළ ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේත්, ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේත්, ආදාහනාගාරයේත් CCTV කැමරා පද්ධතියක් සවි කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණය**

පරිපූරක ඇස්තමේන්තුවෙහි CCTV කැමරා පද්ධතියක් සවි කරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති හෙයින් ,කසළ ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේත්, ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේත්, ආදාහනාගාරයේත් CCTV කැමරා පද්ධතියක් සවි කිරීම සුදුසු බවට තීරණය විය.

02.පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ මහජන පහසුකම් සැළසීමට මතුව් ඇති ශ්‍රම ගැටළුවට විසඳුමක් ලෙස 23,ඌරදෙණිය ,සන්නස්ගම ,ලෙල්ලෝපිටිය ලිපිනයේ පදිංචි යූ.ප්‍රේමරත්න මහතා වැඩ ක්ෂේත්‍ර කම්කරුවෙකු ලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණය**

වැඩ ක්ෂේත්‍ර කම්කරු පුරප්පාඩු 05ක් හා මුදල් ප්‍රතිපාදන පවතින හෙයින් ආදාහනාගාරය සඳහා වැඩ ක්ෂේත්‍ර කම්කරුවෙකු බඳවා ගැනීම සුදුසු බව තීරණය විය.

**හදිසි යෝජනා අංක 03**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා.</u>**

කෙටේතැන්න බොරාල දක්වා දිවෙන මාර්ගයේ හොරගස්ඕවිට ගමේ මීටර 75ක පමණ කොටසක් සංවර්ධනය සඳහා රු.ලක්ෂ 20ක මුදලක් ලැබී ඇති නමුත් මෙම ස්ථානයේ (මාර්ගය මැද)පතල් හාරා ඇති අතර තවත් ස්ථාන කිහිපයක ඉල්ලම් ඉතුරු වී ඇති නිසා මෙම ස්ථානය පතල් කැණීම සඳහා වෙන්දේසි කොට කැණීම් අවසන් වූ පසුව,නැවත මාර්ගය සංවර්ධනය සඳහා යොමු කර දෙන මෙන් ඉල්ලන අතර,මෙම රු.ලක්ෂ 20ක මුදල අප කොට්ඨාශයේ පට්ටියදෙණිය ගමට යන මාර්ගය සංවර්ධනය සඳහා වෙන් කර දෙන ලෙසට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණය**

කෙටේතැන්න බොරාල දක්වා දිවෙන මාර්ගයේ හොරගස්ඕවිට ගමේ මීටර 75ක පමණ මාර්ගය සම්පූර්ණ හාරා පස් ඉවත් කර සංවර්ධනය කළ යුතු මාර්ගයක් බවට ප්‍රදේශවාසීන් හා ගරු මන්ත්‍රී තුමා විසින් යොජනා කළ අතර,මෙම මාර්ගය ඉල්ලම් සහිත මාර්ගයක් වන බැවින් එය රාජ්‍ය මැණික් සංස්ථාව හරහා මැණික් ගැරීමට වෙන්දේසි කර ලැබෙන මුදලද උපයෝගි කර ගනිමින් මෙම මාර්ගය සංවර්ධනය කිරීමටත්,එහිදී මේ සඳහා දැනට වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් නොවුනහොත් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන යොදවමින් මාර්ගය සංවර්ධනය කිරීම හා මෙම රු.ලක්ෂ 20ක මුදල අප කොට්ඨාශයේ පට්ටියදෙණිය ගමට යන මාර්ගය සංවර්ධනය සඳහා වෙන් කිරීම සුදුසු බව තීරණය කරන ලදි.

**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

2025.09.26 පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව, 2025.10.13 පැවති පරිසර හා පොදු පහසුකම් කමිටු වාර්තාව, 2025.11.17 කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපතිධූරයෙන් ඉල්ලා අස්වන ලදි.

**08.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.09.01 සිට 2025.09.30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සභා ගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා ප.ව1.30ට සභාවෙන් පිට විය.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා**

පළතුරු වෙළඳාම් කිරීම සම්බන්ධව ස්ථිර කඩ හිමියන්ගෙන් විරෝධතාවයක් පල වන බවත්,ගනේගම හංදියේ වාහනයක තට්ටුවක් තබා ගෙන අඩු මිලට පළතුරු වෙළඳාම් කිරීම තුලින් පැල්මඩුල්ල ජනතාවට සහනයක් සැළසුනත්,ස්ථිර කඩ හිමියන් විදුලි බිල් ,කඩ කුලී ගෙවා ව්‍යාපාර කරන අයට අසාධාරණයක් සිදු වන බවයි. මේ අය ඉවත් නොකර අනෙක් ව්‍යාපාරිකයන් සමඟ සාකච්ඡා කර එක මිලකට ව්‍යාපාරය කරගෙන යන ලෙසත් නැතිනම් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා**

බැරැණ්ඩුව කොට්ඨාශයේ බුදුලෙන ගම්මානයේ පෙර පාසල අක්‍රීයව පවතිනව.නමුත් ප්‍රදේශවාසී දෙමව්පියන් විසින් 2026 වර්ෂයේ මෙම පෙර පාසල ආරම්භ කිරීමට තීරණය කර ඇති බවත්,එහි ඇති වැසිකිළිය අවධානම් තත්වයේ පවතින හෙයින් එම වැසිකිළිය සැකසීමටත්,සෙල්ලම් උද්‍යානය සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා**

කිරිදි ඇල්ල සංචාරක ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍යයි.නමුත් මෙහි පිවිසුම් මාර්ගය සුදුසු ස්ථානයක ස්ථාපිත නොකර ඇති බවත්,කිරිදි ඇල්ල මාර්ගයේ ගමන් කළ කෙනෙක් නැවත එම මාර්ගය භාවිතා නොකරන බවත්,පැල්මඩුල්ල නගරයේ සිට කිරිදි ඇල්ලට5 ½ km ක් පමන දුරක් බවත්,උඩතුල හරහා 3 kmකින් කිරිදි ඇල්ලට පිවිසිය හැකි බවත් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙසත්,ස්වාභාවික තටාකයක් ලෙස සංවර්ධනය කිරීමට හැකි නම් සංචාරක ආකර්ශණය වැඩි වශයෙන් ලබා ගත යුතු බවයි.මෙම ඇල්ල සංවර්ධනය කරනවානම් විධිමත් ක්‍රමවේදයකට අනුව සංවර්ධනය කළ යුතු බවයි.

- **සභාපතිතුමාගේ ස්තුති කිරීම.**

අද දින සභාවට පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

- ප.ව.2.00ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ගරු ප්‍රාදේශීය සභා .................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ......................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2025-12-10 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව